6 වැනි සහ 7 වැනි සැසි

**මානව අවශ්‍යතා - මානව හිමිකම් - මානව වගකීම්**

# කථා කිරීමේ උපක්‍රම

## උපක්‍රම සහ කතන්දර පෝස්ටර්




THE LOCAL
CHANGEMAKERS
COURSE

# මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා උපක්‍රම





**හදිසි උපක්‍රම**

වළක්වා ගැනීම, නැවැත්වීම සහ බේරාගැනීම

උපකාර ඉල්ලා සිටීම සහ අනතුරු ඇඟවීම

**පරිවර්තන උපක්‍රම**

විරෝධතා ව්‍යාපාර

උද්දේශනය

දිරිගැන්වීම් ලබාදීම

ප්‍රතික්ෂේප කිරීම

**ගොඩනැගීමේ උපක්‍රම**

දැනුවත්භාවය ගොඩනගන්න

සම්බන්ධවීම් ගොඩනගන්න

කුසලතා ගොඩනගන්න

ජාල ගොඩනගන්න

**සුව කිරීමේ උපක්‍රම**

සහාය දීම

ලේඛනගත කිරීම

යුක්තිය ඉල්ලා සිටීම

අනුස්මරණය කිරීම







# හදිසි උපක්‍රම

නිශ්චිත පුද්ගලයින්ට, නිශ්චිත ස්ථානවලදී සිදුවීමට ආසන්න හෝ සිදුවෙමින් පවතින මානව හිමිකම් උල්ලංඝනයවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට අපි හදිසි උපක්‍රම භාවිතා කරන්නෙමු. සිදුවීමට ආසන්න අපයෝජන වළක්වා ගැනීමටත්, සිදුවෙමින් පවතින අපයෝජන නැවැත්වීම සඳහා උපකාර ඉල්ලා සිටීමට සහ මිනිසුන්ට අනතුරු ඇඟවීමටත් හදිසි උපක්‍රම භාවිතා කරනු ලැබේ.

හදිසි අවස්ථා සෑමවිටම මහා පරිමාණ ඒවා නොවිය හැක – සේවා ස්ථානය වෙත බසයෙන් ගමන්ගන්නා අතර වෛරී කථනයට ලක්වීමත් එයින් පීඩාවට පත්වන පුද්ගලයාට හදිසි අවස්ථාවකි.

**ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස සම්බන්ධ 'හදිසි අවස්ථා' සඳහා උදාහරණ**

හිරිහැරය, වෛරී ප්‍රකාශ සහ වෛරී අපරාධ – උදා: අන්තර්ජාලය හරහා හෝ මුහුණට මුහුණ සිදු කෙරෙන වාචික ප්‍රහාර, ප්‍රචණ්ඩත්වයට පෙළඹවීම, පහරදීම්, දේපළ විනාශ කිරීම, ආගමික ස්ථානවලට පහර දීම, වාර්ගික ප්‍රචණ්ඩත්වය සහ අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම්.

# උපක්‍රමය
# වළක්වා ගැනීම

අපයෝජන වළක්වා ගැනීමට උත්සාහ කිරීම වළක්වා ගැනීමේ උපක්‍රමවලට ඇතුළත් වේ. මෙයට බොහෝ විට අපයෝජකයින්ව අධෛර්යමත් කිරීම සඳහා ප්‍රජාවන් සහ සිවිල් සංවිධාන විසින් දෘශ්‍යමානව, ශාරීරිකව පෙනී සිටීම ඇතුළත් වේ. ප්‍රහාරයක අවදානමට ලක්ව සිටින පුද්ගලයින්ව තනි නොකර කණ්ඩායමක් ලෙස සිටිමින් ඔවුන්ට ආරක්ෂාව සැපයීම, හෝ පුද්ගලයින් පිළිබඳව පරීක්ෂාවෙන් සිටින බව නිලධාරීන් දැන ගන්නා බව සහතික කිරීම සඳහා එම පුද්ගලයින් සමග පොලිස් ස්ථාන වෙත යාම මෙයට ඇතුළත් විය හැක.

බලධාරීන් සම්බන්ධයෙන් ගත් කල, අපයෝජන හෝ නිලධාරීන්ගේ අපොහොසත්වීම් අනාවරණය වන බව සහ ඒවා සම්බන්ධයෙන් නිසි පරිදි කටයුතු කරන බව සහතික කිරීම සඳහා අධීක්ෂණ හා වාර්තා කිරීමේ ක්‍රමවේද ස්ථාපිත කිරීම එයට ඇතුළත් වේ.




ඊශ්‍රායල සොල්දාදුවෙකු සමග සාකච්ඡා කරන මැච්සම් වොච් සංවිධානයේ සාමාජිකාවක් ඡායාරූපය EDDIE GERALD /ALAMY STOCK PHOTO

# හමුදා මුරපොලවල සිටින සාක්ෂිකරුවන්, ඊශ්‍රායලය

අත්පත්කර ගෙන ඇති බටහිර ඉවුර සහ ඊශ්‍රායලය අතර සීමාව හරහා ගමන් කරන පලස්තීනුවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනයවීම වැළැක්වීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂාවෙන් 2001 වර්ෂයේ දී ඊශ්‍රායල හමුදා මුරපොලකදී සොල්දාදුවන්ගේ හැසිරීම නිරීක්ෂණය කිරීමට ඊශ්‍රායල කාන්තාවෝ තිදෙනෙක් තීරණය කළහ. ඔවුන්ගේ මේ මුලපිරීමෙන් මැච්සම් වොච් (Machsom Watch) සංවිධානය බිහිවූ අතර, මේ වන විට මුරපොළ ගණනාවක් පිළිබඳව සෑම දිනකම පරීක්ෂාවෙන් සිටින ස්වේච්ඡා ක්‍රියාකාරිනියෝ 300 ක් එහි සිටිති.

මිනිසුන් ගමන් කිරීම නැවැත්වීමට හෝ හැඳුනුම්පත් තම භාරයට ගැනීමට සොල්දාදුවන් උත්සාහ කරන විට, එම අධීක්ෂකයෝ, තම මැදිහත්වීමෙන් බලපෑමක් ඇති වේ යැයි සිතන්නේ නම්, නිහඬව, එහෙත් ප්‍රබලව මැදිහත් වෙති. ඔවුන් බරපතල උල්ලංඝනයවීම් දුටු විට ඉහළ හමුදා නිලධාරීන්ට පැමිණිලි කරන අතර, එසේ කිරීමට පලස්තීනුවන් ද දිරිමත් කරති. තමන් දුටු අපයෝජන පිළිබඳ සවිස්තර වාර්තා ප්‍රකාශයට පත් කරති.

මූලාශ්‍රය: New Tactics in Human Rights, www.newtactics.org; Machsom Watch, https://machsomwatch.org



උතුරු අයර්ලන්තයේ දෙපිරිස වෙන්කරන 'සාම පවුරක්'　　ඡායාරූපය ANDREW PARSONS / ALAMY STOCK PHOTO

# පවුරට ඉහළින් කථාබහ කිරීම, උතුරු අයර්ලන්තය

රෙපරාමාදු වරුන් (උතුරු අයර්ලන්තය එක්සත් රාජධානියෙහි කොටසක් ලෙස තිබීමට කැමති අය) සහ කතෝලික අයර්ලන්ත රිපබ්ලිකන්වරුන් අතර වසර තිහකට වැඩි කාලයක් පැවති දේශපාලන ප්‍රචණ්ඩත්වයෙන් පුද්ගලයින් 3,500 ට අධික සංඛ්‍යාවක් මිය ගියහ. වෙන් වෙන්ව ජීවත් වන මෙම ප්‍රජාවන් අතර ප්‍රචණ්ඩත්වය අවම කිරීමේ අරමුණින් තැනූ මීටර් 3-8 ක් පමණ උස 'සාම පවුර' නම් තාප්ප වලින් ඔවුන් ශාරීරිකව වෙන් වී සිටිති.

දේශපාලන ප්‍රචණ්ඩත්වය පැවති කාලයේදී (1968-1998), පවුරෙන් අනෙක් පැත්තෙහි සිදු වන්නේ කුමක්ද යන්න පිළිබඳ ඇතිවූ සැකය ප්‍රචණ්ඩත්වයට හේතු විය. ඉන්ටරැක්ෂන් බෙල්ෆාස්ට් (Interaction Belfast) සංවිධානය පවුර දෙපස ම ස්වේච්ඡා සාමාජිකයින්ගෙන් සමන්විත ජාලයක් ගොඩනගා, ඔවුන්ට සන්නිවේදනය කිරීමට ජංගම දුරකථන ලබා දෙන ලදී. එම ස්වේච්ඡා සාමාජිකයින් උද්‍රාවෙමින් පවතින තත්වයන් පිළිබඳව අනතුරු ඇඟවීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා එකිනෙකාට දුරකථනයෙන් කථා කළහ. විශේෂයෙන් ම දේශපාලන පෙළපාළි වැනි සංවේදී සිදුවීම් වලදී නිවැරදි තොරතුරු පතුරවමින්, සැකය අඩුකර, ප්‍රණ්ඩත්වය වළක්වා ගත්හ.

**මූලාශ්‍රය**: New Tactics in Human rights, www.newtactics.org; Interaction Belfast, www.peacewall.org

# උපක්‍රමය
# නැවැත්වීම සහ බේරාගැනීම

සිදු වෙමින් පවතින අපයෝජන නැවැත්වීමට සෘජුව මැදිහත්වීම සහ අනතුරට පත් අය ආරක්ෂිත ස්ථානයකට ගෙන ඒම මීට ඇතුළත් වේ.

වෛරී ප්‍රකාශ හෝ හිරිහැර සිදු කරන පුද්ගලයින්ට අභියෝග කිරීම හෝ ඔවුන්ගේ අවධානය වෙනතකට යොමු කිරීම ප්‍රසිද්ධ ස්ථානවල හෝ අන්තර්ජාලයේ සිදු වන අපයෝජන වැළැක්වීමේ එක් ක්‍රමයකි. අපයෝජන නැවැත්වීම සඳහා භෞතිකමය බාධක නිර්මාණය කිරීම,
උදා: අවදානමට ලක්විය හැකි ආගමික ස්ථාන වටා මිනිස් දම්වැල් සෑදීම හෝ ප්‍රචණ්ඩකාරී මැර පිරිස්, සන්නද්ධ කණ්ඩායම් හෝ හමුදාව ඉදිරියට ඒම මන්දගාමී කිරීම සඳහා පාරේ වාහන නවතා තැබීම ආදිය, තවත් ක්‍රමයක් වේ. මෙම උපක්‍රම අනුගමනය කිරීමේදී බොහෝ විට අවදානමක් ද තිබේ.



ඡායාරූපය R.M. Modi / Alamy Stock Photo

# ආගම් දෙකකට අයත්වන යුවල් ආරක්ෂා කිරීම, ඉන්දියාව

ඉන්දියාවේ සාම්ප්‍රදායික කුල ක්‍රමය මගින් මිනිසුන්ව විවිධ කුල හතරකට සහ දාලිත්වරුන් (කුලහීනයින්) ලෙස බෙදා ඇත. කුල අතර සහ ආගම් අතර සිදු වන විවාහ දැඩි අප්‍රසාදයට ලක් වේ. ආගම් අතර කෙරෙන විවාහ, මංගල උත්සවයට දින තිහකට පෙර ලියාපදිංචි කළ යුතු බවත්, විවාහ මංගල්‍යය පිළිබඳ සැලසුම් ගැන පවුල්වලට දැනුම් දිය යුතු බවත් නීතියෙහි සඳහන් කර ඇත. බොහෝ යුවල් මෙම කාලය තුළ පවුලේ අයගේ පළිගැනීම් වලට ලක් වෙතැයි බියෙන් ජීවත් වෙති. ඇතැම් ප්‍රාන්තවල 'විවාහය මගින් ආගම වෙනස් කිරීම' තහනම් කරන නීති හඳුන්වා දී ඇති අතර, එමගින් යුවල් අත්අඩංගුවට පත්වීමේ අවදානමක් ද තිබේ.

ආදරය කිරීම සඳහා අයිතිය ('Right to Love') යනු ආගම් හෝ කුල දෙකකට අයත් යුවල් ආරක්ෂා කිරීම සඳහා වූ ව්‍යාපාරයකි. ඔවුන් එවැනි යුවල් වලට පොලිස් ආරක්ෂාව සහ ආරක්ෂිත නවාතැන් පහසුකම්, විවාහ ලියාපදිංචිය සඳහා නීති සහාය, සහ මානසික පීඩනය නැතිකර ගැනීමට උපදේශනය ද ලබා ගැනීම සඳහා උපකාර කරයි. එය මාධ්‍යවේදීන් දෙදෙනෙකු විසින් ස්වේච්ඡා පදනමක් මත ක්‍රියාත්මක කරනු ලැබේ.

මූලාශ්‍රය: Newsclick, www.newsclick.in

# උපක්‍රමය

# උපකාර ඉල්ලා සිටීම සහ අනතුරු ඇඟවීම

බොහෝ විට, අපට උල්ලංඝනය වීමක් වැළැක්වීමට හෝ නැවැත්වීමට බලයක් නැත. අපට අවශ්‍ය බලපෑම කළ හැකි පුද්ගලයින් ගෙන් උපකාර ඉල්ලා සිටීමට සහ අනතුරේ සිටින පුද්ගලයින්ට ආරක්ෂා වීමට හැකි වන පරිදි අනතුරු ඇඟවීමට සිදු විය හැකිය.

අපට ප්‍රාදේශීය හා ජාතික මට්ටමේ ආගමික නායකයින් ඇතුළු ප්‍රජා නායකයින් ගෙන් උපකාර ඉල්ලා සිටිය හැක – උදාහරණයක් ලෙස ප්‍රජාව තුළ ඇති වන කලබල හෝ ප්‍රචණ්ඩකාරී වාතාවරණ සන්සුන් කිරීමට. යම් රාජ්‍ය නිලධාරියෙක් උල්ලංඝනය වීමක් සිදු කරන්නේ නම් හෝ උල්ලංඝනය වීමක් නැවැත්වීමට මැදිහත් වීමට අපොහොසත් වන්නේ නම්, මැදිහත් වන ලෙස දේශපාලන නායකයින් ගෙන් හෝ ප්‍රාදේශීය හෝ ජාතික මට්ටමේ ඉහළ නිලධාරීන් ගෙන් ඉල්ලා සිටීමට හැකිය. මැදිහත් වන ලෙස නිලධාරීන්ට බලපෑම් කිරීම සඳහා සහ පීඩනයක් ඇති කිරීම සඳහා අපට ජනමාධ්‍ය ද භාවිතා කළ හැකිය.



ඡායාරූපය MATYAS REHAK / ALAMY STOCK PHOTO

# කෝලාහලයක් වැළැක්වීමට උපකාර ඉල්ලා සිටීම, ඉන්දියාව

2007 දී හින්දු ජාතිකවාදීහු හර්යානා ප්‍රාන්තයේ පානීපත් නගරයේ වාර්ගික කෝලාහලයක් ඇති කිරීමට උත්සාහ කළහ. මේ අය මුස්ලිම් පල්ලියක් තුළ හොර රහසේ හින්දු ප්‍රතිමා තබා, එම පල්ලිය ‘හින්දු දෙවිවරුන් මතු වූ’ හින්දු පූජනීය ස්ථානයක් යැයි පවසමින් එය හින්දු කෝවිලක් බවට පත් කරන ලෙස ඉල්ලා කෝලාහලයක් ඇති කිරීමට මිනිසුන්ව පෙළඹවූහ. එම පිළිම සොයා ගැනීමත් සමග අනතුර ගැන අවබෝධ කරගත් මුස්ලිම් පල්ලියේ නායකයෝ, නගරයේ අන්තර්-ආගමික සංවාදය සහ සාමය ප්‍රවර්ධනය කරන Bhagat Sigh Se Dosti නැමති සංවිධානය වහාම සම්බන්ධ කර ගත්හ.

විරෝධතා දැක්වීම ප්‍රචණ්ඩ ප්‍රතිචාරයකට හේතු විය හැකි බැවින්, මෙම අවස්ථාවේ විරෝධතා නොදක්වා සන්සුන්ව සිටින ලෙස ඔවුන් එක්ව මුස්ලිම් ප්‍රජාවෙන් ඉල්ලා සිටියහ. අන්තර් ආගමික සංවිධානය ප්‍රතිමා ඉවත් කිරීම සඳහා හින්දු නායකයින්ව ඒකරාශි කර ගත්තේය. පිළිම ගෞරවයෙන් යුතුව ඉවත් කරන ලද අතර කිසිදු කලබලයක් ඇති නොවීය.

මූලාශ්‍රය: Centre for the Study of Society and Secularism and Adv. Ram Mohan Roy



සුදු රෝස ව්‍යාපාරය, මියන්මාරය    ඡායාරූපය BHRN

# සහයෝගිතා ක්‍රියාකාරිත්වය බලධාරීන්ට බලපායි, මියන්මාරය

2019 දී, යැංගොන් නගරයේ බෞද්ධ අන්ත ජාතිකවාදීන් 100 ට වැඩි සන්නද්ධ කණ්ඩායමක් රාමසාන් උත්සවය සමයේ දී නිල වශයෙන් අවසර ලබා තිබූ තාවකාලික යාච්ඤා නිවාස තුනකට රැස්ව සිටි මුස්ලිම්වරුන්ට තර්ජනය කළහ. යාච්ඤා රැස්වීම් නොපැවැත්වීමට එකඟ වන ප්‍රකාශයකට අත්සන් කිරීමට ප්‍රාදේශීය මුස්ලිම් නායකයින්ට බලකරනු ලැබූ අතර, මැර පිරිසගේ පීඩනය මත බලධාරීහු යාච්ඤා නිවාස වසා දැමූහ.

ක්‍රියාකාරීන් සහ ඉහළ පෙළේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා ක්ෂණිකව ප්‍රතිචාර දක්වමින් පීඩාවට පත් මුස්ලිම් ප්‍රජාවන් වෙත ගොස් ඔවුන්ට සහයෝගය දැක්වීමක් වශයෙන් සුදු රෝස මල් පිරිනැමූහ. මූලික වශයෙන් ම, තරුණ බෞද්ධ ක්‍රියාකාරීන් විසින් මෙහෙයවනු ලැබූ 'සුදු රෝස' ව්‍යාපාරය සමාජ මාධ්‍ය හරහා ශක්තිමත් වෙමින් නගර පුරා ව්‍යාප්ත විය. මේ අතර, Religions for Peace (සාමය සඳහා ආගම්) නැමති සංවිධානයේ නායකයින් ආගමික කටයුතු හා සංස්කෘතික අමාත්‍යාංශය වෙත පැමිණ යාඥා නිවාස නැවත විවෘත කරන ලෙස ඉල්ලා සිටි අතර, පැය 24 ක් ඇතුළත එම යාච්ඤා නිවාස විවෘත කරන ලදී.

මූලාශ්‍රය: Kyaw Win, Burma Human Rights Network, bhrn.org.uk





# පරිවර්තනය කිරීමේ උපක්‍රම

තීරණ ගන්නා අයට බලපෑම් කිරීම සඳහා අපි පරිවර්තනය කිරීමේ උපක්‍රම භාවිතා කරමු. තීරණ ගන්නෙකු යනු නීති, ප්‍රතිපත්ති සහ කටයුතු කරන ක්‍රම පරිවර්තනය කිරීමේ බලය ඇති අයෙකි. රජය (සාම්ප්‍රදායික නායකයින් ද ඇතුළුව), පාසල්, රෝහල් හෝ අධිකරණ පද්ධති වැනි පොදු ආයතන තුළ සහ ආගමික ප්‍රජාවන් සහ ව්‍යාපාර තුළ තීරණ ගන්නන් වේ.

පරිවර්තනය කිරීමේ උපක්‍රම මගින් තමන්ට බලපෑමක් ඇති කළ හැකි මානව හිමිකම් ගැටළු විසඳීම සඳහා ක්‍රියාකාරී පියවර ගැනීමට තීරණ ගන්නන්ට පීඩනයක් එල්ල කරයි. මෙම උපක්‍රම ගැටලු පිළිබඳව මහජනතාව දක්වන සැලකිලිමත්වීමෙහි ශක්තිය ඉස්මතු කරන අතර විසඳුම් යෝජනා කරයි. සමාජය ක්‍රියාකරන ආකාරය තුළට කාවැදී ඇති දිගු කාලීන මානව හිමිකම් උල්ලංඝනයවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා මෙම උපක්‍රම බොහෝ විට යොදා ගනු ලැබේ, උදා: නීති, රීති, ප්‍රතිපත්ති, පිළිවෙත් සහ කාර්ය ක්‍රම වෙනස් කිරීම මගින්.

පරිවර්තනය කිරීමේ උපක්‍රම වර්ග හතරකි: විරෝධතා ව්‍යාපාර, උද්දේශනය, දිරිගැන්වීම් සහ ප්‍රතික්ෂේප කිරීම.

# උපක්‍රමය
# විරෝධතා ව්‍යාපාර පැවැත්වීම

උද්ඝෝෂණය යනු පරිවර්තනය ඇති කරන ලෙස ඉල්ලා පීඩනයක් ඇති කිරීම සඳහා සාමාන්‍ය ජනතාව ඒකරාශි වී ක්‍රියාමාර්ග ගැනීමයි. මානව හිමිකම් උල්ලංඝනයවීම් වලට එරෙහිව හැකි තාක් දුරට දෘශ්‍ය වන පරිදි මහජන විරෝධය දැක්වීම සහ අප යෝජනා කරන විසඳුම් සඳහා ලැබෙන මහජන සහයෝගය ඉස්මතු කර පෙන්වීම එයට ඇතුළත් ය. ජනමාධ්‍යවල අවධානය ලබා ගැනීම විරෝධතා ව්‍යාපාර උපක්‍රමවල වැදගත් අංගයක් වේ. මහජන අදහස් ඉස්මතු කර දැක්වීම සහ උද්ඝෝෂණවලට මහජන සහභාගීත්වය ලබා ගැනීම සඳහා සමාජ මාධ්‍ය ප්‍රධාන මෙවලමක් වේ.

විරෝධතා ව්‍යාපාරවලට සියලු ආකාරවල විරෝධතා – එනම් පෙත්සම් සහ ලිපි ලිවීම, වීදි විරෝධතා, ගායනා හෝ වීදි කලාවන් තුළින් විරෝධය දැක්වීම, යම් වර්ණයක ඇඳුම් ඇඳීම හෝ විශේෂ අත් සංඥා භාවිතය වැනි සංකේතාත්මක ක්‍රියා වල සිට, නිවසේ ආරක්ෂාව තුළ සිටිමින්, දවසේ යම් වේලාවක පහන් නිවා දැමීම හෝ සාස්පාන්වලට ගසමින් ශබ්ද කිරීම වැනි සම්බන්ධීකරණය සහිත, දෘශ්‍ය ක්‍රියාමාර්ග ඇතුළත් වේ.




දිල්ලියේ වීදිවල විරෝධතා චිත්‍ර

ඡායාරූපය SUDIPTA DAS / ALAMY STOCK PHOTO

# කලාකරුවෝ පුරවැසි නීතිවලට විරෝධය පළ කරති, ඉන්දියාව

සෑම අයෙකු ම පුරවැසිභාවය සනාථ කළ යුතු බවට නීතියක් ඉන්දීය රජය හඳුන්වා දී ඇත. කිසිවෙකුට පුරවැසිභාවය අහිමි වීමේ සහ රඳවා තබා ගැනීමට භාජනය වීමේ අවදානමට ලක් විය නොහැක. බොහෝ දුගී පුද්ගලයින්ට උප්පැන්න සහතික නැත. නීතිය සෑම කෙනෙකුට ම පොදු ය, එහෙත් තවත් නව නීතියක් මගින් අසල්වැසි මුස්ලිම් බහුතරයක් සහිත රටවලදී හිංසනයට ගොදුරු විය හැකි හින්දු, සීක් සහ ක්‍රිස්තියානි සුළුතර කණ්ඩායම්වලට පුරවැසිභාවය ලබා දෙයි. මෙම නීති එකට ගත්විට දුගී මුස්ලිම් ජනයා රටක් අහිමි තත්වයට සහ රැඳවීමට ලක්වීමේ අවදානමට මුහුණ දෙති.

ඉන්දියාව පුරා සිටින කලාකරුවෝ විරෝධතාකරුවන්ගේ ඉල්ලීම් සඳහන් පෝස්ටර් අලවමින්, බිතු සිතුවම් නිර්මාණය කරමින්, සහ ඉන්දියාවේ දැවැන්ත සිතියමක ස්වරූපයේ මූර්තියක් නිර්මාණය කරමින් නව නීතිවලට එරෙහිව පුළුල් විරෝධතාවලට සහභාගී වූහ.

**මූලාශ්‍රය**: Al Jazeera

# උපක්‍රමය
# උද්දේශනය

උද්දේශනය යනු ඒත්තු ගැන්වීම වන අතර, එය සාමාන්‍යයෙන් නිහඬව, බොහෝ විට දොරවල් වසා පවත්වන සංවාද හරහා සිදු කෙරේ. පරිවර්තනය කිරීම සඳහා වන යෝජනා හෝ නිශ්චිත ක්‍රියාමාර්ග ගැනීම සඳහා සහාය දීමට තීරණ ගන්නන් යොමු කිරීම කෙරෙහි ඉන් අවධානය යොමු කරයි. සාර්ථක උද්දේශනය කාලයත් සමග ගොඩනැගෙන විශ්වාසවන්ත සම්බන්ධතා තුළින් නිර්මාණය වීමේ නැඹුරුවක් ඇත. 'ඒත්තු ගන්වන්නාගේ' නීත්‍යානුකූලභාවය සහ බලපෑම වැඩි වන තරමට සාර්ථකවීමේ හැකියාව ද වැඩි වේ.

තීරණ ගන්නන්ව ඒත්තු ගැන්වීමට උපකාරී වන තර්කවලට පහත කරුණු ඇතුළත් වේ:

- ගැටළුවෙන් සමාජයට ඇති කරන සෘණාත්මක බලපෑම් පිළිබඳ සාක්ෂි සහ යෝජිත විසඳුම වෙනත් ස්ථානවල සාර්ථක වූ ආකාරය පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීම.
- ගැටළු අඛණ්ඩව පැවතීමට ඉඩ දීමෙන් තීරණ ගන්නන්ට හෝ ඔවුන්ගේ ආයතනයට ඇති විය හැකි අවදානම් – උදා: අපකීර්තිය – ඉස්මතු කර පෙන්වීම.
- පරිවර්තනය සඳහා සහයෝගය දැක්වීමට පියවර ගැනීමෙන් තීරණ ගන්නන්ට දේශපාලන හෝ කීර්තිනාමය අතින් ලැබෙන වාසි ඉස්මතු කර පෙන්වීම.
- සමාජයේ සුභසාධනය ආරක්ෂා කිරීමේ වගකීම පැවරී ඇති, සදාචාරාත්මක හා නීතිමය වගකීම් දරන්නෙකු වශයෙන් තීරණ ගන්නාගේ ඇති වටිනාකම ඉස්මතු කර පෙන්වීම.



කිර්ගිස්තානයේ පාර්ලිමේන්තුව

ඡායාරූපය ROBERT WYATT / ALAMY STOCK PHOTO

# පාර්ලිමේන්තුවට බලපෑම් කිරීමට ආගමික නායකයෝ එකට එක්වෙති, කිර්ගිස්තානය

2012 වර්ෂයේ දී ආගම පිළිබඳ නීතියට සංශෝධන යෝජනා කළ විට, කිර්ගිස්තානයේ විශාලතම ආගමික ප්‍රජාවන් හයෙහි නායකයින් එයට ප්‍රතිචාර දැක්වීමට තීරණය කළහ. ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස සඳහා ඇති අයිතිය පිළිබඳව කලින් පුහුණුව ලබා තිබූ මෙම නායකයින්, එම යෝජනා මගින් එම අයිතියෙහි අංග ගණනාවක් උල්ලංඝනය වන බවත් එමගින් ආගමික කණ්ඩායම් අතර ආතතීන් නිර්මාණය වීමේ අවදානමක් ඇති වන බවත් දැනගත්හ. යෝජිත සංශෝධන ප්‍රතික්ෂේප කරන ලෙස ඉල්ලා ඔවුහු ආගමික කටයුතු පිළිබඳ රාජ්‍ය කොමිසමට සහ පාර්ලිමේන්තුවට ඒකාබද්ධ ලිපියක් ඉදිරිපත් කළහ. එම ලිපිය සලකා බැලූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංශෝධනවලට එරෙහිව ඡන්දය ප්‍රකාශ කළහ.

**මූලාශ්‍රය**: Vladislav Hegay, Interfaith Council of Kyrgyzstan



රජයේ අනුග්‍රහය යටතේ ආරාමයට පහර දෙන මැරයින් ඡායාරූපය BPSOS

# ප්‍රාදේශීය ප්‍රජාවන් සඳහා ජාත්‍යන්තර උද්දේශනය, වියට්නාමය

සිවිල් සමාජය ජාත්‍යන්තර මට්ටමෙන් සම්බන්ධ කරගැනීම දේශීය ආගමික ප්‍රජාවල අයිතිවාසිකම් වෙනුවෙන් සාර්ථකව උද්දේශනය කිරීමට සහ විරෝධතා ව්‍යාපාර පැවැත්වීමට දායක විය හැකිය. වියට්නාමයේ Thien An Abbey නැමති කතෝලික ආරාමයට අයත් පයින් වනාන්තර හෙක්ටයාර 107 ක් බලහත්කාරයෙන් අත්පත් කර ගැනීමට පසුගිය දශක හතර තුළදී ප්‍රාදේශීය බලධාරීන් උත්සාහ කළහ. බලහත්කාරයෙන් ඉඩම් අල්ලා ගැනීමේ ව්‍යාපාරය පසුගිය වසර වලදී තීව්‍ර වී තිබේ.

ඉතිරි වී තිබූ හෙක්ටයාර් 59 ක ඉඩම් අල්ලා ගැනීමේ උත්සාහයක නිරත වූ ප්‍රාදේශීය රජය 2020 දී කුලී මැර කණ්ඩායම් යොදා පූජකවරුන්ට පහර දෙමින් ආරාමය වට කළහ. රාජ්‍ය රූපවාහිනිය ද අසපුව පිළිබඳ අසත්‍ය, අපහාසාත්මක තොරතුරු විකාශය කළේය. එයට ප්‍රතිචාර වශයෙන්, BPSOS නම් වියට්නාම ඩයස්පෝරා සංවිධානය ජාත්‍යන්තර උද්දේශන සහ මාධ්‍ය වැඩසටහන් ව්‍යාපාරයක් මෙහෙය වූ අතර, එමගින් කලහකාරී පිරිස් විසුරුවා, ජාත්‍යන්තර සහයෝගය ප්‍රබල ලෙස පෙන්නුම් කිරීමට හැකි විය.

මූලාශ්‍රය: BPSOS, www.bpsos.org



ඡායාරූපය PACIFIC PRESS MEDIA PRODUCTION CORP. / ALAMY STOCK PHOTO

# භූමදාන අයිතිය සඳහා වූ ව්‍යාපාරය, ශ්‍රී ලංකාව

කෝවිඩ් මෘතදේහ භූමදානය කිරීම මගින් අවදානමක් ඇති නොවන බව ලෝක සෞඛ්‍ය සංවිධානය ප්‍රකාශ කර තිබියදීත් 2020 අප්‍රේල් මාසයේ සිට එම මෘතදේහ ආදාහනය කළ යුතු යැයි ශ්‍රී ලංකා රජය නියම කරන ලදී. ඉස්ලාම් ආගමේ ආදාහනය කිරීම තහනම්ය. 2021 මාර්තු මාසය වන විට කෝවිඩ් රෝගීන් ගෙන් තුනෙන් දෙකක් ම සුළුතර කණ්ඩායම්වලට අයත් වූවන් විය. බොහෝ දෙනා රෝග විනිශ්චය සහ ආදාහනය ගැන බියෙන් ප්‍රතිකාර ගැනීමෙන් වැළකුනහ.

දේශපාලන පක්ෂ, නීතීඥයින්, ඉස්ලාමීය සංවිධාන, සහ සියලුම ආගම්වලට අයත් සිවිල් සංවිධානවල ක්‍රියාකාරීන් මෙම පනත් කෙටුම්පතට එරෙහිව පෙත්සම් ඉදිරිපත් කළහ. නිතිපතා පෙලපාලි පැවැත්වූ අතර, පවුල් එකොළහක් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කළහ. ළදරු දේහයක් බලහත්කාරයෙන් ආදාහනය කිරීම පුළුල් මහජන මැදිහත්වීමකට හේතු වූ අතර, සියලුම ආගම්වලට අයත් අය අදාළ ආදාහනාගාර දොරටුවේ සුදු පටි ගැට ගැසූහ.

මූලාශ්‍රය: BBC news, Alarabiya.net

# උපක්‍රමය
# දිරිගැන්වීම්

දිරිගැන්වීමේ උපක්‍රම පුද්ගලයින්ට සහ සංවිධානවලට – උදා: පාසල්, ව්‍යාපාර හිමියන්ට හෝ රාජ්‍ය නිලධාරීන්ට – දිරිගැන්වීමක් ලබා දීම මගින් ඔවුන්ට නිවැරදි දේ තෝරා ගැනීම පහසු කරවයි. දිරිගැන්වීම් මූල්‍යමය හෝ ගෞරවය හා පිළිගැනීම ස්වරූපයෙන් විය හැකිය.

උදා: හිරිහැරය හෝ වෙනස්කොට සැලකීම නැවැත්වීමට සහ වෛරය මැඩපැවැත්වීමට ගුරුවරයෙකුගේ, පාසල් පාලක මණ්ඩලයේ, ව්‍යාපාරිකයෙකුගේ හෝ ආගමික නායකයෙකුගේ දායකත්වය පිළිගැනීමට ලක්කරමින් සම්මාන පිරිනැමීම.




ඡායාරූපය FRIEDRICH STARK / ALAMY STOCK PHOTO

# ස්ත්‍රී ලිංග ඡේදනය අවසන් කිරීමට දිරිගැන්වීම්, සියෙරා ලියෝනය

මේ පිළිවෙත මේ වන විට සියෙරා ලියොන්හි නීති විරෝධී වුවද, ඇස්තමේන්තු කර ඇති පරිදි කාන්තාවන්ගෙන් 90% ක් ම, ක්‍රිස්තියානි හෝ ඉස්ලාම් ආගමටත් වඩා පැරණි කාලයක සිට පැවත එන සාම්ප්‍රදායික සංස්කෘතික පිළිවෙතක් වන ස්ත්‍රී ලිංගඡේදනය සිදුකරගෙන ඇත.

බිම් මට්ටමේ උද්ඝෝෂණකරුවන් ස්ත්‍රී ලිංගඡේදනයෙහි සෞඛ්‍ය අවදානම පිළිබඳව ප්‍රජාවන් දැනුවත් කිරීමට ප්‍රජාවන් සමග කටයුතු කරති. එම පිළිවෙත ඉටුකරන ප්‍රාදේශීය කාන්තාවන්ගේ භූමිකා හඳුනාගෙන එය වෙනස් කිරීමට ඔවුහු උත්සාහ කරති. එහි අරමුණ මෙම කාන්තාවන්ට විකල්ප ආදායම් මාර්ග සොයා දී ලිංග ඡේදනය ඇතුළත් නොවූ සම්ප්‍රදායික සංස්කෘතිය ආරක්ෂා කරන්නන් ලෙස ඔවුන්ගේ භූමිකා වෙනස් කිරීම යන දෙආකාරයෙන් ම ඔවුන්ට දිරිගැන්වීම් ලබා දීමයි.

මූලාශ්‍රය: The Lancet

# උපක්‍රමය
# ප්‍රතික්ෂේප කිරීම

ඇතැම්විට ආණ්ඩු, සහ ආගමික හෝ වෙනත් බලතල දරන්නන් මිනිසුන් සාමකාමීව තම මානව හිමිකම් ක්‍රියාත්මක කිරීම වළක්වති. ප්‍රතික්ෂේප කිරීම යනු සම්මත හෝ අවිධිමත් හෝ නීතිමය සීමා සහ තහනම් නොතකා මානව හිමිකම් විවෘතව ක්‍රියාත්මක කිරීමයි. මේ සඳහා ඇති වඩාත්ම පොදු උදාහරණය නීති විරෝධී විරෝධතා ය. නීත්‍යානුකූල නොවන තහනම් නොතකා ආගමික ප්‍රජාවන් වන්දනා කිරීම සඳහා අඛණ්ඩව හමුවීම, අන්තර් ආගමික යුවල් තහනම් නොතකා විවාහ වීම, සහ සාමකාමී, එහෙත් තහනම් අදහස් (උදා: ඇතැම් සංදර්භවලදී අදේවවාදී විශ්වාස, විවෘතව ප්‍රකාශ කිරීම) ප්‍රතික්ෂේප කිරීම සඳහා තවත් උදාහරණ වේ. මෙම උපක්‍රම බොහෝ විට ඉතා අනතුරුදායක වේ.



කරච්චි නුවර පැවැත්වෙන එච්.අයි.වී. පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහනකට සහභාගී වන සංක්‍රාන්ති ලිංගික කාන්තාවන්.

ඡායාරූපය ASIANET-PAKISTAN / SHUTTERSTOCK

# සංක්‍රාන්ති ලිංගික කාන්තාවන්ට සුරක්ෂිත අවකාශ, පාකිස්තානය

පාකිස්තානයේ සංක්‍රාන්ති ලිංගික අය බොහෝ විට තම පවුල් විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අතර සිඟමන් යැදීමෙන්, නර්තනයෙන් හෝ ගණිකා වෘත්තියෙහි යෙදීමෙන් ජීවත්වීමට ඔවුන්ට සිදු වී තිබේ. ඔවුන්ට ආගමික ස්ථානවලට පැමිණීම සඳහා නිල සීමාකිරීම් නොතිබුණ ද, බොහෝ විට එම ස්ථානවලට ඇතුල්වීමට ඉඩ දීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඉස්ලාමාබාද් නගරාසන්නයේ සංක්‍රාන්ති ලිංගික කතක් සම්මතයට පටහැනිව යමින් සංක්‍රාන්ති ලිංගික අය සඳහා එරට ප්‍රථම මද්‍රාසා පාසල විවෘත කිරීමෙන් සංක්‍රාන්ති ලිංගික පුද්ගලයින්ට අධ්‍යාපනය ලබා ගැනීමට සහ විශ්වාස පිළිබඳ දැනුම වැඩි කරගැනීමට අවකාශ සලසා දී තිබේ මේ අතර, කරච්චි නුවර දේවගැතිවරියක් පල්ලියේ බලධාරීන් ඇයට එම පරිශ්‍රය භාවිතා කිරීමට ඉඩ දීම ප්‍රතික්ෂේප කළ නිසා තම නිවස පිහිටි භූමියේ සංක්‍රාන්ති ලිංගික අය සඳහා වන ප්‍රථම දේවස්ථානය විවෘත කළාය.

> ”අපි වෙනත් පල්ලිවලට යනවිට, ඇතුළට යාමට පෙර අපේ කොණ්ඩය කපන්නැයි ඔවුන් කියනවා.”

මූලාශ්‍රය: Aljazeera; gandhara.rflerl.org

# ගොඩනැගීමේ උපක්‍රම

ගොඩනැගීමේ උපක්‍රම යනු මානව හිමිකම් 'සංස්කෘතියක්' ගොඩනැගීම සඳහා වන දිගු කාලීන කාර්යයකි. සමාජයේ සෑම අයෙකුම –

- අපට තිබෙන මානව හිමිකම් මොනවා දැයි දන්නා,
- මානව හිමිකම්වලට ගරු කිරීම සාමාන්‍ය සහ නිවැරදි දෙයක් ලෙස දකින,
- මානව හිමිකම්වලට ගරු කිරීමේ දී හා ආරක්ෂා කිරීමේ දී තම කාර්ය භාරය – උදා: ගුරුවරයෙකු, පොලිස් නිලධාරියෙකු, නීති සම්පාදකවරයෙකු, ව්‍යාපාරිකයෙකු හෝ ආගමික නායකයෙකු ලෙස – අවබෝධ කර ගත්,
- තමන්ගේ සහ අන් අයගේ අයිතිවාසිකම් වෙනුවෙන් නැගී සිටින්නේ කෙසේද සහ අයිතිවාසිකම් කඩ වුව හොත් කුමක් කළ යුතුද යන්න දන්නා පුද්ගලයින් වන සමාජයක් ගොඩනැගීමට කටයුතු කිරීමයි.

මෙවැනි 'සංස්කෘතියක්' නිර්මාණය කිරීම සාමාන්‍ය ජනතාව අතර මෙන්ම සියලු ම රාජ්‍ය හා පෞද්ගලික ආයතන තුළ දැනුවත්භාවය, නියැළීම්, කුසලතා සහ ජාල ගොඩනැගීම ඇතුළත් වන දීර්ඝ කාලීන ක්‍රියාවලියකි. ගොඩනැගීමේ උපක්‍රම මගින් දැනුවත්, නියැළුණු, සවිබල ගැන්වූ පුරවැසියන් සහ ආයතන ඇතිවීම සඳහා පූර්ව කොන්දේසි නිර්මාණය කරයි.

# උපක්‍රමය
# දැනුවත්භාවය ඇතිකිරීම

ප්‍රජාවක සිටින සියලු දෙනාම මානව හිමිකම් පිළිබඳව දැනුවත් කිරීම එම අයිතිවාසිකම් අගය කරන ප්‍රජාවක් ගොඩනැගීමේ පළමු පියවරයි. බොහෝ විට, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව නැත හොත් ජාතික නීතියට අනුව තමන්ට ඇති අයිතිවාසිකම් මොනවා දැයි ජනතාව නොදනිති. මෙම නොදැනුවත්භාවය රජය, පාලක පන්තිය හෝ ප්‍රජාවේ වෙනත් බලවතුන් සිදු කරන අපචාර ක්‍රියා පිළිගැනීමට, ඉවසා සිටීමට හෝ නොසලකා හැරීමට ජනතාව යොමු කරයි.

මෙම උපක්‍රමයට පහත කරුණු පිළිබඳ දැනුවත්භාවය ගොඩනැගීම ඇතුළත් වේ:

- සංකල්පයක් ලෙස මානව අයිතිවාසිකම්
- ජනතාවට ජාත්‍යන්තර සහ ජාතික මට්ටමින් ඇති ආරක්ෂාව
- සාමාන්‍ය ජනයාගේ ජීවිතයට බලපාන ප්‍රජා මට්ටමේ මානව හිමිකම් ගැටළු.

දැනුවත්භාවය ගොඩනැගීම මානව හිමිකම් ප්‍රවර්ධනය සඳහා වඩාත් බහුලව භාවිතා කරන උපක්‍රමයකි. තම ජීවිත සඳහා මානව හිමිකම්වල වැදගත්කම අවබෝධ කරදීමට සහ අපයෝජන මගහරවා ගැනීම සඳහා මානව හිමිකම් මෙවලමක් වන්නේ කෙසේද යන්න අවබෝධ කර ගැනීමට මිනිසුන්ට උපකාර කිරීම විශාල ම අභියෝගය වේ.



ඡායාරූපය GUISEPPE MASCI / ALAMY STOCK PHOTO

# සාමය ගොඩනැගීම සඳහා දැනුවත්භාවය, ටැන්සානියාව

කියන්ගා ගමේ ක්‍රිස්තියානුවන් දේවස්ථානයක් ඉදිකරන විට, බහුතර මුස්ලිම් ප්‍රජාවෙහි පිරිසක් එයට විරෝධය පළ කරමින්, ප්‍රදේශයේ මුස්ලිම් පල්ලි ගණනාවක් ම තබියදීත්, එය ඉදිරිපසින් ම තාවකාලික මුස්ලිම් පල්ලියක් ඉදි කළහ. එයට විරෝධය දැක්වීමට රැස් වූ ක්‍රිස්තියානුවන් සහ මුස්ලිම්වරුන් අතර අඛණ්ඩ ආරවුලක් වර්ධනය වූ අතර, මුලින් ආරම්භ වූ මඩ ගසා ගැනීම් පසුව ශාරීරික ප්‍රචණ්ඩත්වය දක්වා වර්ධනය විය.

සැන්සිබාර් අන්තර් ආගමික මධ්‍යස්ථානය (Zanzibar Interfaith Centre) විසින් එම ගමෙහි අන්තර් ආගමික කමිටුවක් සංවිධානය කර, ගැටුම අවසන් කිරීම සඳහා මාස ගණනාවක් වෙහෙසී වැඩ කළේය. ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස සඳහා ඇති අයිතිය පිළිබඳව මිනිසුන්ට ඉගැන්වූ අතර, එහි වැදගත්කම ඔවුන්ට පැහැදිලි කර දුන්හ. අවසානයේ දී, එම ප්‍රජාවන් සාමකාමී සහජීවනයට එකඟ වූහ.

> ”සැන්සිබාරයේ මුස්ලිම්වරුන්ට සහ ක්‍රිස්තියානුවන්ට සාමය ගොඩනැගීම ගැන ඉගැන්වීමට අන්තර් ආගමික කමිටු දැඩි වෙහෙසක් දරනවා.” හිදයා ඩූඩ්, සැන්සිබාර් අන්තර් ආගමික මධ්‍යස්ථානයේ (Zanzibar Interfaith Centre) සාමාජික.

මූලාශ්‍රය: Zanzibar Interfaith Centre



ඩාලියා සහ රියුදා යාඥා කරමින් ඡායාරූපය TAADUDIYA

# එක්ව යාච්ඤා කිරීම, ලෙබනනය

2015 දී, බේරූට්හි තරුණ ෂියා මුස්ලිම් කාන්තාවක් වූ දාලියාට සුන්නි සහ ෂියා මුස්ලිම්වරුන් අතර ඇති නිකායවාදී අදහස් සහ බෙදීම්වලට අභියෝග කිරීමට අවශ්‍ය විය. තමන් සමග ෂියා සහ සුන්නි දෙවර්ගයේ ම මුස්ලිම් පල්ලිවලට ගොස් යාච්ඤා කිරීමට කැමති සුන්නි කාන්තාවක් සිටින්නේ දැයි ඇය ෆේස්බුක් හරහා විමසුවාය. රියුදා එයට ප්‍රතිචාර දැක්වූ අතර, ඔවුන් දෙදෙනා එක්ව යාච්ඤාවලට සහභාගීවී ඒ අවස්ථාවල ඡායාරූප ෆේස්බුක් ජාලයේ පළ කළහ.

ඔවුන්ට මිශ්‍ර ප්‍රතිචාර ලැබුණ නමුත්, නිකායවාදී විවාදය ගැන දැනුවත් කිරීම හා ඒ වෙත අවධානය යොමු කිරීම සාර්ථක විය. එයින් මාස නවයකට පසුව, කොප්ටික් ක්‍රිස්තියානි මිතුරෙකු සමග එක්ව ඇයගේ අදහස අනුකරණය කිරීමට පෙළඹුණු, ඊජිප්තුවේ වෙසෙන සෞදි ජාතිකයෙකු දාලියාව සම්බන්ධ කර ගත්තේය.

> "පුද්ගලයෙක් පියවරක් ගත යුතුය. සමාජයේ ඕනෑම පරිවර්තනයක් ආරම්භ වන්නේ එක් පුද්ගලයෙකුගෙනි."
> *රියුදා*

මූලාශ්‍රය: Taadudiya, www.taadudiya.com

# උපක්‍රමය
# සම්බන්ධවීම් ගොඩනැගීම

මෙම උපක්‍රමය, දැනුවත්වීමේ සිට ක්‍රියාකාරීවීම දක්වා ගමන් කිරීමට මිනිසුන්ට උපකාර කරයි. ඕනෑම උපක්‍රමයක් භාවිතයෙන් මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා නැගී සිටීමට සහ ක්‍රියා කිරීමට කැමති පුද්ගල කොට්ඨාසය පුළුල් කිරීම එයට ඇතුළත් වේ. තමන් දකින උල්ලංඝනයවීම් වලට ප්‍රතිචාර දැක්වීමට හෝ ඒවා වාර්තා කිරීමට සම්බන්ධ විය හැකි ක්‍රම නිර්මාණය කර දීම, උද්ඝෝෂණවලට සම්බන්ධවීමට හෝ ප්‍රජා දැනුවත්භාවය ඇතිකිරීමේ වැඩසටහන් හෝ පීඩාවට පත් වූවන්ට මනෝ සමාජයීය හා ද්‍රව්‍යමය සහයෝගය ලබා දීමේ වැඩසටහන් වලට ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වීමට මිනිසුන් දිරිමත් කිරීම මෙයින් අදහස් කෙරෙනු ඇත.



ඡායාරූපය PROSTOCK-STUDIO / SHUTTERSTOCK

# සහයෝගීතාවය දැක්වීමට මිනිසුන් ක්‍රියාකාරී කිරීම, කැනඩාව

ආගමික ස්ථානවලට එල්ල කරන ප්‍රහාරවල ගෝලීය වර්ධනයක් මෑතක දී දක්නට ලැබේ. කැනඩාවේ ක්වෙබෙක් පළාතේ මුස්ලිම් පල්ලියකට එල්ල වූ ප්‍රහාරයෙන් පසු, යුදෙව් දේවස්ථාන, පල්ලි සහ පන්සල්වලින් පැමිණි අයගෙන් සැදුම්ලත් සාම කව සහයෝගීත්වය පෙන්නුම් කිරීම සඳහා ටොරොන්ටෝ නගරයේ (තවත් කැනේඩියානු නගරයක්) පිහිටි මුස්ලිම් පල්ලි වටා සිටගන්නා ලදී. මෙය, නෝර්වේ හි මුස්ලිම් තරුණයින්, අසල්වැසි ඩෙන්මාර්කයේ යුදෙව් ආගමික ස්ථානයකට ප්‍රහාර එල්ලවීමෙන් අනතුරුව, තම රටේ යුදෙව් ආගමික ස්ථානයක් වටා සාම වළල්ලක් ලෙස සිටගැනීම ඇසුරින් ලැබූ පෙළඹීම මත කරන ලද්දකි.

> "මුස්ලිම් සමාජය ගැන සැබවින් ම සැලකිලිමත් වන යුදෙව්වන්, ක්‍රිස්තියානුවන්, වෙනත් ආගම් අදහන අය හෝ විශේෂ ඇදහිල්ලක් නැති අය මෙලෙස කටයුතු කරනු දක්නට ලැබීම ඇත්තෙන්ම සැනසිලිදායකයි."
> *ඉලියාස් ඇලි, සහකාර ඉමාම්, ඉස්ලාම් තොරතුරු සහ දවා මධ්‍යස්ථානය (Islamic Information and Dawah Centre), ටොරොන්ටෝ*

**මූලාශ්‍රය**: CBC News

# උපක්‍රමය
# කුසලතා ගොඩනැගීම

බොහෝ විට යහපත් සිතුවිලි සහිත මිනිසුන්ට මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ කුසලතා හෝ ඒ සඳහා ආත්ම විශ්වාසය හෝ නැත. සාමාන්‍ය ජනතාවට, තම ප්‍රජාව තුළ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමෙහි නියැළීමට කුසලතා සහ විශ්වාසය අවශ්‍ය වේ. එමෙන්ම ප්‍රජා ජීවිතයේ විවිධ අංශවල මනා ක්‍රියාකාරීත්වය සඳහා වගකීම දරන රාජ්‍ය නිලධාරීන් සහ ව්‍යාපාරික, ප්‍රජා හා ආගමික නායකයින්ට සහ මිනිසුන් අයිතිවාසිකම් උල්ලංඝනයවීම් වලට ගොදුරු වීමේ අවදානම සහිත සන්දර්භයන්ට ද එය අදාළ වේ.

ඇතැම් විට, මානව හිමිකම් උල්ලංඝනයවීම් අඛණ්ඩව සිදුවන්නේ ප්‍රජා නායකයින් සහ නිලධාරීන් ‘මෙතෙක් කෙරුනු ක්‍රමයට ම’ කටයුතු කරන නිසා සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට උපකාරී වන ආකාරයෙන් වෙනස් ලෙස වැඩ කිරීමට නොදන්නා නිසා ය. මිනිසුන් හානි වලින් වඩා හොඳින් ආරක්ෂා කරන කුසලතා ලබා ගැනීමට සහ නව, ප්‍රායෝගික හා යථාර්ථවාදී වැඩ කරන ක්‍රම සොයා ගැනීමට ඔවුන්ට උපකාර කිරීම පරිවර්තනයක් ඇති කිරීම සඳහා ඉතා වැදගත් උපක්‍රමයකි.



සාම්ප්‍රදායික උත්සවයකට සහභාගිවන ස්වදේශික කාන්තාවක්, මෙක්සිකෝව　　ඡායාරූපය ARTERRA PICTURE LIBRARY / ALAMY STOCK PHOTO

# අයිතිවාසිකම් රැකගැනීමට කුසලතා, මෙක්සිකෝව

Network of Community Human Rights Defenders (ප්‍රජා මානව හිමිකම් ආරක්ෂකයින්ගේ ජාලය) නැමති සංවිධානය දුගී ග්‍රාමීය ප්‍රජාවන් විසින් නම් කරනු ලබන ආදිවාසී ප්‍රජා සාමාජිකයින් ඔවුන්ගේ මානව හිමිකම් අධීක්ෂණය කිරීමට සහ ආරක්ෂා කිරීමට පුහුණු කරයි. ඔවුන්ට මානව හිමිකම් පිළිබඳව සහ, ඡායාරූපකරණය සහ පරිගණක භාවිතය වැනි ප්‍රායෝගික කුසලතා පුහුණුව ද ලබා දෙයි.

උල්ලංඝනවීම් සිදු වූ විට ඔවුහු වාචික සාක්ෂි එකතු කිරීම, වීඩියෝ සහ ඡායාරූප සාක්ෂි එකතු කිරීම, රජයට පැමිණිලි කිරීම, පුවත්පත් හා මානව හිමිකම් නිරීක්ෂණ කණ්ඩායම්වලට දැන්වීම ආදිය සිදු කරති. අසාධාරණ ලෙස රඳවාගෙන සිටින මිනිසුන් නිදහස් කරන ලෙස ඉල්ලා සිටිති. මානව හිමිකම් උල්ලංඝනයවීමකට ආසන්න අවස්ථාවන්හි දී පූර්වාරක්ෂාව සඳහා ඉල්ලීමක් ගොනු කරන ආකාරය ද දනිති. තම අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ආන්තික ප්‍රජාවන්ට එකට සම්බන්ධ විය හැකි බව ඔවුන්ගේ අත්දැකීම් වලින් පෙන්නුම් කරයි.

මූලාශ්‍රය: New Tactics in Human Rights, www.newtactics.org

# උපක්‍රමය
# ජාල ගොඩ නැගීම

පොදු අරමුණක් සාක්ෂාත් කර ගැනීම සඳහා සම්බන්ධීකරණයෙන් යුතු, ඒකාබද්ධ හා අනුපූරක ක්‍රියාමාර්ග ගන්නා පුද්ගලයින්ගේ හා සංවිධානවල ජාල මගින් වෙනස වඩාත් ඵලදායි ලෙස සාක්ෂාත් කර ගත හැකි බව පර්යේෂණ මගින් පෙන්වා දී ඇත. ප්‍රජාවන් තුළ මිනිසුන් සහ සංවිධාන අතරෙහි ජාල ගොඩනැගිය හැකි අතර, ප්‍රාදේශීය මට්ටමේ සංවිධාන ජාතික මට්ටමට සහ ජාතික මට්ටමේ සිට ජාත්‍යන්තර මට්ටමට සම්බන්ධ කිරීම සඳහා ද ජාල ගොඩනැගිය හැක.

ප්‍රජාවන් අතර හෝ අංශ අතර – උදා: ව්‍යාපාරික ප්‍රජාව සමග හෝ ආගමික ප්‍රජාවන් අතර – සන්ධාන ගොඩනැගීම මගින් බලපෑම් ඇති කිරීමේ නව ආකාර නිර්මාණය කළ හැක. ජාලය පුළුල් වන තරමට එයට ගත හැකි ක්‍රියාමාර්ග පරාසය ද පුළුල් වන අතර එහි බලපෑම සහ නීත්‍යානුකූලභාවය ද වැඩි වේ. මානව හිමිකම් වෙනුවෙන් කටයුතු කරන පුද්ගලයින්ට සහ සංවිධානවලට දැනෙන හුදෙකලා බව නැති කිරීමට සහ ඔවුන් මුහුණ දෙන අවදානම් අවම කිරීමට ජාල උපකාරී වෙයි.



ජාලයේ සාමාජිකාවන් ජිනීවා නුවර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දී රාජ්‍ය තාන්ත්‍රිකයින්ට කරුණු පැහැදිලි කරමින්

ඡායාරූපය IRAQI WOMEN'S NETWORK

# කාන්තා අයිතිවාසිකම් සඳහා ජාල ගොඩනැගීම, ඉරාකය

2004 වර්ෂයේ දී නව ඉරාක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කිරීමේ දී ඉරාක ශ්‍රේෂ්ඨාධිකරණය පුද්ගලික සිවිල් තත්ත්වය පිළිබඳ නීතිවල පදනම ලෙස ෂරියා නීති සංග්‍රහය ඇතුළත් කරන 137 වැනි නියෝගය යෝජනා කළේය. ඉරාක කාන්තා ජාලය යනු රට පුරා සියයකට අධික සමාජ සංවිධානවල එකතුවකි. මෙම නියෝගය මගින් වෙනස්කොට සැලකීම ආයතනගත කරන බවත්, ළමා විවාහ හා ගෞරවය සඳහා සිදුකරන ඝාතන නීත්‍යානුකූල කරන බවත් තර්ක කරමින්, මෙම ජාලය විසින් විශාල විරෝධතා සහ උද්දේශන ව්‍යාපාරයක් සම්බන්ධීකරණය කරන ලද අතර, එම වගන්තිය ඉවත් කර ගන්නා තෙක් ම විරෝධතා අඛණ්ඩව සිදු කරන ලදී. අද ඔවුහු තම අයිතිවාසිකම් පිළිබඳව කාන්තාවන්ගේ දැනුවත්භාවය ඉහළ නංවමින්, ප්‍රාදේශීය සහ ජාතික මැතිවරණවලට ඉදිරිපත්වීමට කාන්තාවන්ව දිරිමත් කරමින්, දේශපාලන ව්‍යාපාර සිදුකිරීමට කාන්තාවන්ව පුහුණු කරති.

> "එකට එක්ව වැඩ කිරීමෙන් අපට සැබෑ ශක්තියක් ලැබෙනවා. එය අපගේ අයිතිවාසිකම් ඉල්ලා සිටීමේදී අපට විශාල හඬක් ලබා දෙමින් සැබෑ යුක්තිය ඉටු කර ගැනීමට උපකාරී වෙනවා."
> *අමල් කබාෂි, සම්බන්ධීකාරක, ඉරාක කාන්තා ජාල (Iraqi Women's Networks)*

**මූලාශ්‍රය**: Women's International League for Peace and Freedom, www.wilpf.org



චාතිස්ගාර් ප්‍රාන්තයේ පිටිසර ගමක ජල පොම්පයක් අසල සිටින කාන්තාවන් ඡායාරූපය JOERG BOETHLING / ALAMY STOCK PHOTO

# චාතිස්ගාර් ප්‍රදේශයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, ඉන්දියාව

ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස පිළිබඳ පුහුණුවකට සහභාගී වීමෙන් පසුව ඉන්දියාවේ චාතිස්ගාර් ප්‍රාන්තයේ 25 දෙනෙකු ගෙන් පමණ සමන්විත කණ්ඩායමක් නිතර හමු වී එම ප්‍රාන්තයේ ක්‍රිස්තියානි ප්‍රජාවන්ගේ ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස ආරක්ෂා කරන කණ්ඩායමක් පිහිටුවා ගත්හ.

ආගමික සුළුතර කණ්ඩායම් ඉන්දියාවේ ග්‍රාමීය ප්‍රදේශවල සමාජයෙන් නිතරම කොන්කිරීමට ලක් වේ. චාතිස්ගාර් ප්‍රාන්තයේ ක්‍රිස්තියානි ආගමට හැරුණු පුද්ගලයෙකුට ගම හැර යන ලෙස බල කිරීම සඳහා ගම් වැසියන් ඔහුට ආහාර හා ජලය වැනි මූලික පහසුකම් ලබා නොදීම ගැන සාකච්ඡා කිරීම සඳහා රැස්වූ විට එම පුද්ගලයා දුෂ්කරතාවලට මුහුණ දුන්නේ ය. මේ පිළිබඳව දැනගත් එම කණ්ඩායම ගම්වාසීන් වෙත පැමිණ, පුද්ගලයින්ගේ ආගම නිසා ඔවුන්ව ඉලක්ක කිරීම නීති විරෝධී බව පෙන්වා දෙමින්, එම පුද්ගලයාට ව්‍යවස්ථානුකූලව සහතික කර දී ඇති නිදහස පිළිබඳව කතා කළහ. ආරක්ෂාකාරී පියවරක් ලෙස, සිදුවීම ගැන දැනුම්දීමට පොලිසිය ද කැඳවූහ. අවසානයේ දී ගම්වාසීහු තම සැලසුම් තවදුරටත් ඉදිරියට ගෙන නොයෑමට තීරණය කළහ.

මූලාශ්‍රය: Stefanus Alliance International, www.stefanusalliansen.no



# සුව කිරීමේ උපක්‍රම

මානව හිමිකම් උල්ලංඝනයවීම්වල බලපෑම ඉන් සිදු වූ ක්ෂණික පීඩාවට වඩා බොහෝ කාලයක් පවතියි. උල්ලංඝනයවීම් හේතුවෙන් ඇති වන කම්පනය, ආර්ථික දුෂ්කරතා සහ විශ්වාසය බිඳවැටීම හේතුවෙන් ජීවිත හා ප්‍රජාවන් විනාශ විය හැක. සුවකිරීමේ උපක්‍රම යනු උල්ලංඝනයවීම් සිදු වූ පසු පුද්ගලයින්ට සහ ප්‍රජාවන්ට සුවය, යුක්තිය සහ සංහිඳියාව අත් කර ගැනීමට උපකාර කිරීම සඳහා අප කුමක් කරන්නේ ද යන්න වේ.


ආරක්ෂිත නවාතැන් හෝ උපදේශනය වැනි ප්‍රායෝගික සහාය සපයා දීම, උල්ලංඝනයවීම් වසන් කළ නොහැකි බව සහතික කිරීම සඳහා සහ නීතිමය ක්‍රියාවලීන් සඳහා සාක්ෂි තහවුරු කිරීම පිණිස එම උල්ලංඝනයවීම් ලේඛනගත කිරීම, වින්දිතයින්ට යුක්තිය හා වන්දි ලබා ගැනීමට උපකාර කිරීමේ ප්‍රයත්න සහ අපයෝජන සිහිපත් කිරීම මෙම උපක්‍රමවලට ඇතුළත් වේ.

මෙම උපක්‍රම මගින් අතීතයේ සිදු වූ දේවල් කෙරෙහි අවධානය යොමු කරන නමුත්, අනාගතයේ දී එවැනි අපචාර සිදුවීම වැළැක්වීම සඳහා ඒවා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එමගින් හානියට පත් ප්‍රජාවන් ශක්තිමත් කිරීමට, අපයෝජකයින්ට දඬුවම් නොලැබ සිටීමට ඉඩ සලසන දණ්ඩමුක්තිය අවසන් කිරීමට සහ වින්දිතයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අයගේ වේදනාව පිළිගෙන එය සිහිපත් කිරීමට අවකාශයක් නිර්මාණය කිරීමට හැකි වේ.

# උපක්‍රමය
# ද්‍රව්‍යමය හා මනෝසමාජයීය සහාය

මානව හිමිකම් උල්ලංඝනයවීම් අත්විඳින පුද්ගලයින්ට ක්ෂණික සහ දීර්ඝ කාලීන සහයෝගය අවශ්‍ය විය හැක. සිදු වී ඇති දේ අනුව අවශ්‍ය කරන සහයෝගයේ ස්වභාවය වෙනස් වේ. උදා: පුද්ගලයෙක් කම්පනයට පත්වී සිටින විට ඔහුට තමන් අසලින් වාඩිවී සිටීමට කෙනෙක්, වෛද්‍ය ප්‍රතිකාර සඳහා ප්‍රවේශය හෝ නැවතී සිටීම සඳහා ආරක්ෂිත ස්ථානයක් අවශ්‍ය විය හැක; ප්‍රචණ්ඩත්වයෙන් අවතැන් වූ පුද්ගලයින්ට තාවකාලික නිවාස සහ ආහාර, සහ කම්පනයෙන් පෙළෙන පුද්ගලයින්ට දීර්ඝ කාලීන මානසික සහාය අවශ්‍ය වේ.

පුද්ගලයින්ට රැකවරණය සැලසීම සඳහා අවශ්‍ය කරන සම්පත් වලින් බොහොමයක් ප්‍රජාවන් තුළ ඇති අවිධිමත් ආධාරක ජාල හරහා සොයා ගත හැකිය. මෙම අවිධිමත් ආධාරක පද්ධති ශක්තිමත් කිරීම ප්‍රජාවෙහි ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීමට දායක විය හැක. ඒ සමග ම, අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති පුරවැසියන්ව රැකබලා ගැනීමේ වගකීම ඉටු කරන ලෙස රජයෙන් ඉල්ලා සිටීම ද වැදගත් වේ.



ඡායාරූපය DENYS SMYRNOV / ALAMY STOCK PHOTO

# ISIL ගැටුම්වලින් දිවි ගලවා ගත් අය සඳහා යෝගා සහ මිත්‍රත්වය, ඉරාකය

යසිදිවරුන් යනු පූර්ව-ඉස්ලාමීය, ඉස්ලාමීය, ක්‍රිස්තියානි සහ සෝරැස්ට්‍රියානු සම්ප්‍රදායන්ගේ ආභාෂය ලැබූ ආගමක් සහිත, උතුරු ඉරාකය මූලික කර ගෙන ජීවත් වන වාර්ගික ආගමික ප්‍රජාවකි. සියවස් ගණනාවක් පුරා හිංසනයට ලක්ව ඇති යසිදිවරුන් මෑත කාලීනව Islamic State (ISIL) සංවිධානයේ හිංසනයට ලක් විය.

2014 වර්ෂයේ දී ISIL සටන්කාමීන් අසීසා නැමති කාන්තාව අල්ලා ගෙන ඉස්ලාම් ආගමට හැරෙන ලෙස බල කරන ලදී. වසර හතරකට පසුව ඇය ඔවුන්ගෙන් බේරී පලා ගිය නමුත් ඇය පශ්චාත් කම්පන මානසික ආතතියෙන් පීඩා විඳියි. තම පවුලේ වැඩි දෙනෙක් ජර්මනියට පළා ගොස් ඇති නිසා ඔවුන් නොමැතිව ඇයට ජීවත්වීම ඉතා දුෂ්කර වී තිබේ. 2019 දී ඇය WEPO නැමති දේශීය රාජ්‍ය නොවන සංවිධානයක් විසින් පවත්වනු ලබන යෝගා පන්තියකට සම්බන්ධ වූවාය. මෙම පන්ති අවතැන් වූ කාන්තාවන්ට විවේක ගැනීමට, තමන්ගේ හැඟීම් සාකච්ඡා කිරීමට සහ ඔවුන්ගේ නව පරිසරය තුළ මිතුරන් ඇති කර ගැනීමට ආරක්ෂිත අවකාශයකි.

> "අපේ යථාර්ථයෙන් ගැලවෙන්නට එය අපට උපකාරී වෙනවා. මම එහිදී යාළුවෝ ඇති කර ගත්තා.", *අසීසා*

මූලාශ්‍රය: www.kurdistan24.net

# උපක්‍රමය
# උල්ලංඝනයවීම් ලේඛනගත කිරීම

මානව හිමිකම් උල්ලංඝනයවීම් සහ ඒවායේ ප්‍රතිවිපාක පිළිබඳ ස්ථිර, පොදු වාර්තාවක් නිර්මාණය කිරීම උල්ලංඝනයවීම් ලේඛනගත කිරීමට ඇතුළත් වේ. යම් අවස්ථාවක සිදු වූ දේ පිළිබඳ කරුණු ලේඛනගත කිරීම, නැතහොත් වඩාත් පුළුල් ලෙස, වෙනස්කොට සැලකීම් හෝ අයිතිවාසිකම් සීමා කෙරෙන හෝ උල්ලංඝනය කෙරෙන නීති, ප්‍රතිපත්ති සහ කාර්ය ක්‍රමවල සෘණාත්මක බලපෑම් ලේඛනගත කිරීම මින් අදහස් වේ.

මානව හිමිකම් උල්ලංඝනයවීම් වසන් කළ නොහැකිවීම සඳහා ඒවා ලේඛනගත කිරීම වැදගත් වන අතර, ඒවා වෙනත් උපක්‍රම කිහිපයක් සඳහා ද වැදගත් පදනමක් නිර්මාණය කර දෙයි. එක්රැස් කරන කතා සහ සාක්ෂි පහත සඳහන් කාර්යයන් සඳහා භාවිතා කළ හැක:

- නීති ක්‍රියාවලීන්හි දී වින්දිතයින් සඳහා යුක්තිය සහ වන්දි ලබා ගැනීමට,
- සිදු වූ දේ අනුස්මරණය කිරීමට වින්දිතයින්ට උපකාර කිරීමට,
- උල්ලංඝනයවීම් වලට හේතුවූ තත්වයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට තීරණ ගන්නන්ට ඒත්තු ගැන්වීමේ උද්දේශන කටයුතු සඳහා පදනමක් ලෙස,
- ගැටලු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට සහ විරෝධතා ව්‍යාපාර සඳහා ජනතාව ඒකරාශි කර ගැනීමට.




සාකච්ඡාවක නිරතවන PRVI ස්වේච්ඡා සේවකයින් ඡායාරූපය NAHLA CENTER FOR EDUCATION AND RESEARCH

# වෛරී අපරාධ ලේඛනගත කිරීම, බොස්නියා හර්සගොවිනාව

1995 දී බොස්නියානු යුද්ධය අවසානය වන විට එරට ආගමික ස්වරූපය දැඩි ලෙස වෙනස් වී තිබුණි. මුස්ලිම් බහුතරයක් සිටි සමහර ප්‍රදේශ ක්‍රිස්තියානි බහුතරයක් ඇති ප්‍රදේශ බවට පත් වූ අතර, ක්‍රිස්තියානි බහුතරයක් සහිත ප්‍රදේශ මුස්ලිම් බහුතරයක් ඇති ප්‍රදේශ බවට පත්ව තිබුණි. ජනවාර්ගික හා ආගමික ආතතීන් තවදුරටත් පවතින අතර, සිය මුල් ගම් බලා ආපසු යන ජනතාව අදටත් අවදානමට ලක්වෙති.

PRVI යනු විශ්වාසදායක දේශීය හා ජාතික මාධ්‍යවල ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදස (FORB) උල්ලංඝනයවීම් පිළිබඳ පළ වන වාර්තා භාවිතා කරමින් එම උල්ලංඝනයවීම් ලේඛනගත කරන ස්වේච්ඡා සේවකයින් පිරිසකි. ඔවුහු එම සිදුවීම් වර්ගීකරණය කරමින් වාර්ෂික ලැයිස්තුවක් සම්පාදනය කර, බොස්නියාවේ බලධාරීන්ට සහ මාධ්‍යවලටත්, ජාත්‍යන්තර සංවිධානවලටත් ලබා දෙති. දේශීයව හා විදේශ රටවල සිදුවන සිදුවීම් ඉස්මතු කර පෙන්වීම මගින් පරිවර්තනයක් සඳහා පීඩනයක් ඇති කළ හැකි බව එම ස්වේච්ඡා පිරිස විශ්වාස කරති.

> ”මම හිතන්නේ කෙතරම් සුළු වුනත් අපේ සියලු ක්‍රියා වෙනසක් ඇති කිරීමට හේතු වෙනවා.” *එමිනා, PRVI ස්වේච්ඡා සේවිකාවක්*

මූලාශ්‍රය: Emina Frljak, PRVI and the Nahla Center for Education and Research




මුස්ලිම්වරුන්ට ෂන් ප්‍රාන්තයේ ගමකට පිවිසීම සඳහා ඇති අයිතිය සීමාකරන බව දැනුම් දෙන දැන්වීමක්, මියන්මාරය ඡායාරූපය BHRN

# උල්ලංඝනයවීම් ලේඛනගත කිරීම, මියන්මාරය

බර්මා මානව හිමිකම් ජාලය (Burma Human Rights Network) (BHRN) යනු මියන්මාරයේ මුස්ලිම් සහ අනෙකුත් ආගමික සුළුතර කණ්ඩායම්වල තත්වය ඉස්මතු කරන බිම් මට්ටමේ සංවිධානයකි. 2016 වර්ෂයේ දී BHRN ක්‍රියාකාරීන් සම්මුඛ සාකච්ඡා 350 ක් පවත්වමින් එරට බොහෝ නගර සහ ගම් වලින් සාක්ෂි එක් රැස් කර ගත්හ. මුස්ලිම්වරුන් හැඳුනුම්පත් ලබා ගැනීම වැළැක්වීම, විනාශ වූ හා හානියට පත් වූ මුස්ලිම් පල්ලි ගොඩනැගීම බලධාරීන් විසින් අවහිර කිරීම, සහ මුස්ලිම්වරුන්ට ඇතුළුවීම තහනම් කර ඇති ගම්මාන සංඛ්‍යාව සීඝ්‍ර ලෙස ඉහළ යාම පිළිබඳ සිද්ධීන් එලෙස සොයාගත් තොරතුරුවලට ඇතුළත් ය. ඔවුහු 120,000 ක් පමණ වූ වාර්ගික රෝහින්‍යා මුස්ලිම්වරුන්ට සංචරණය, සහ සෞඛ්‍ය රැකවරණය හා අධ්‍යාපනය සඳහා ප්‍රවේශය සීමා කිරීම ඇතුළුව අභ්‍යන්තර අවතැන් කඳවුරුවලට සීමා කරනු ලැබීමෙන් ඔවුන්ට මුහුණ දීමට සිදු වූ තත්ත්වය ලේඛනගත කළහ. 2016 සහ 2017 වර්ෂ වලදී රෝහින්‍යා ප්‍රජාවට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ හිංසන උත්සන්න වීම හේතුවෙන් 800,000 ක් පමණ රෝහින්‍යාවරු අසල්වැසි බංග්ලාදේශයට පළා ගියහ.

> "මුස්ලිම් ප්‍රජාවන්ට එරෙහි උල්ලංඝනයවීම් වල පරිමාණය කොතෙක්ද කියා ජාත්‍යන්තර ප්‍රජාවට එලදායී ලෙස ඉස්මතු කර දැක්වීමට හැකි වන පරිදි අපි සාක්ෂි රැස් කර ප්‍රකාශයට පත් කළා"
> *Kyaw Win, BHRN*

මූලාශ්‍රය: Burma Human Rights Network, www.bhrn.org.uk

# උපක්‍රමය
# යුක්තිය සහ වන්දි ඉල්ලා සිටීම

ජනතාවගේ අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇත්නම් ඔවුන්ට ඒ සම්බන්ධයෙන් යුක්තිය වෙත ප්‍රවේශය ලැබෙන බව සහතික කිරීම රජයෙහි වගකීමක් වේ. වින්දිතයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට වන්දි ගෙවීම සහ අපයෝජකයින්ට දඬුවම් දීම හෝ ඔවුන්ව ලැජ්ජාවට පත් කිරීම මගින් සිදු වූ වරද සාධාරණීය කළ නොහැකි නමුත්, ඒවා වැදගත් කාර්යයක් ඉටු කරයි. වන්දි ලබා දීම වින්දිතයින්ට නැවත යථා තත්වයට පත්වීමට උපකාරී විය හැකි අතර, දඬුවම් ලබා දීම මගින් අයිතීන් උල්ලංඝනය කිරීම් කිසිසේත් ම අනුමත නොකරන බවට පැහැදිලි පණිවිඩයක් ලබා දෙයි. එය සමාජය තුළ නිතර දක්නට ලැබෙන, වරදට දඬුවම් නොදීමේ සංස්කෘතියට එරෙහිව සටන් කිරීමට උපකාරී වෙයි.

මෙම උපක්‍රමය එක් අතකින් යුක්තිය හා වන්දි ලබා ගැනීම සඳහා නීති පද්ධතිය භාවිතා කිරීමට වින්දිතයින්ට උපකාර කිරීම කෙරෙහි, උදාඃ අපරාධ වාර්තා කිරීමේ ක්‍රියාවලියේ දී ඔවුන් කැටුව යමින් හෝ නීති උපදෙස් සහ ආධාර ලබා දීමෙන් උපකාර කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. නමුත් අයුක්තියට එරෙහි පියවර නීතිමය ව්‍යුහයන්ගෙන් පරිබාහිරව ද සිදු විය හැක. අපයෝජන හෙළි කර ගැනීමේ සහ අපරාධකරුවන් වගකිවයුත්තන් බවට පත්කිරීමේ නිර්මාණාත්මක ක්‍රම රාශියක් ඇත – උදාඃ මාධ්‍ය හෝ සමාජ මාධ්‍ය භාවිතා කිරීම.



කඕ දායි උත්සවයක්


ඡායාරූපය All Canada Photos / Alamy Stock Photo

# පහරදීමට ලක්වූවෙකුට නීතී ආධාර සැපයීම, වියට්නාමය

වියට්නාමයේ රජය විසින් මිනිසුන් අනුගමනය කළ යුතු යැයි අපේක්ෂා කරන, රජයට පක්ෂපාතී ආගමික ප්‍රජාවන් නිර්මාණය කරමින්, ආගමික කටයුතු දැඩි ලෙස පාලනය කරයි. ස්වාධීන ආගමික ප්‍රජාවන් හරහා ආගම අදහන පුද්ගලයෝ හිරිහැරවලට මුහුණ දෙති.

ස්වාධීන කඕ දායි අනුගාමික කාන්තාවක් සහ ඇයගේ සහෝදර අනුගාමිකයින් පිරිසක් රාජ්‍ය අනුග්‍රහය ලත් කඕ දායි කණ්ඩායමේ සාමාජිකයින් විසින් තම දේවස්ථානය අත්පත් කර ගැනීමට විරුද්ධවීම නිසා එම කණ්ඩායමේ ශාරීරික ප්‍රහාරයකට ලක් විය. වියට්නාම ඩයස්පෝරා සංවිධානයක් වන BPSOS සංවිධානය ඇය වෙනුවෙන් පෙනී සිටීමට නීතිඥයෙකු යෙදවූයේය. එහි ප්‍රතිඵලයක් ලෙස එම කාන්තාවට නීති පද්ධතිය හරහා වන්දි ලැබුණු අතර, රාජ්‍ය අනුග්‍රහය ඇති කඕ දායි අනුගාමික කණ්ඩායම එම දේවස්ථානය අත්පත් කර ගැනීමේ උත්සාහය අත්හැර දැමූහ. මෙය එම කාන්තාවගේ ජයග්‍රහණයක් පමණක් නොව, වියට්නාම අධිකරණය බෙහෙවින් දේශපාලනීකරණය වී ඇති තත්වය සලකා බැලීමේදී, ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස සඳහා ඇති අයිතිය පිළිබඳ අපේක්ෂා සහගත සංඥාවක් ද විය.

මූලාශ්‍රය: BPSOS, www.bpsos.org




රුසියානු සමූහාණ්ඩුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය

**ඡායාරූපය** OLEG BELOV / ALAMY STOCK PHOTO

# වන්දනාවට එරෙහිව දඩ ගැසීමට නීතියෙන් අභියෝග කිරීම, රුසියාව

රුසියාවේ නීතිය ක්‍රියාත්මක කරන ආයතන වන්දනා කිරීම සඳහා පෞද්ගලික නිවාසවල එක්රැස්වන ආගමික ප්‍රජාවන්ට "ඉඩම් කොටස අනිසි ලෙස භාවිතා කිරීම" යන හේතුව මත පරිපාලන දඩ නියම කර තිබේ.

2019 වර්ෂයේ දී, ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස සඳහා ඇති අයිතිය පිළිබඳ විශේෂඥ නීතීඥයින් මෙම දඩවලට විරුද්ධ වූ ආගමික ප්‍රජාවක් සාර්ථක ලෙස ආරක්ෂා කළහ. කිසිදු බාධාවකින් තොරව නේවාසික පරිශ්‍රයන්හි වන්දනාමාන කිරීමේ හා ආගමික වතාවත් ඉටු කිරීමේ අයිතිය ආගමික සංවිධාන සතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය ඒකමතික තීන්දුවක් ලබා දුන්නේය. ආගමික ගොඩනැගිලි වලින් පිටතදී වන්දනා කිරීම සඳහා රැස්වීම පිළිබඳ රුසියාවේ නිල වශයෙන් පිළිගත් නීති රාමුව පැහැදිලි කිරීමේ විභවය මෙම තීන්දුවට තිබෙන අතර, එය ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ නිදහස සඳහා ඇති අයිතිය ආරක්ෂා කිරීම පිළිබඳ පූර්වාදර්ශයක් ද සපයා දෙයි.

**මූලාශ්‍රය**: Slavic Centre for Law and Justice, www.sclj.ru

# උපක්‍රමය
# අනුස්මරණය කිරීම

ඇතැම් විට මානව හිමිකම් උල්ලංඝනයවීම් වලින් පසුව සාමූහික නිහඬතාවයන් පළ වේ. බලපුළුවන්කාර අපරාධකරුවන් ආරක්ෂා කිරීම සඳහා හෝ අවමානයෙන් බේරා ගැනීම සඳහා බලධාරීන් අපයෝජන සැඟවීමට උත්සාහ කළ හැකිය; අත්විඳි හිංසන පිළිබඳ විවෘතව කතා කිරීමට වඩා සමගිය පිළිබඳව කතා කිරීම යහපත් යැයි ප්‍රජා නායකයින් සිතනු ඇත; ලජ්ජාවේ සංස්කෘතිය මගින් ලිංගික හිංසනයන්ට ගොදුරු වූවන්ව නිහඬ කිරීමට ඉඩ ඇත.

ප්‍රතිකාර නොකළ තුවාල පැසවයි. ඔරොත්තු දෙන, යුක්තිගරුක සහ සංහිඳියාව සහිත ප්‍රජාවන් බිහි කළ හැක්කේ අසාධාරණයන් සිදුවූ බව පිළිගෙන, වින්දිතයින්ට හඬක් ලබා දී, අපරාධකරුවන්ට තම වැරදි පිළිගෙන වෙනස්වීමට අවස්ථාව ලබා දුන් විට පමණි. ගැටුම්කාරී වාතාවරණයන්හි දී, සාමාන්‍යයෙන් සෑම 'පාර්ශ්වයකම' වින්දිතයින් සහ අපරාධකරුවන් සිටිති.

අනුස්මරණය විවිධ ස්වරූප ගත හැකිය – උදා: වාර්ෂික සැමරුම්, සිදුවීම්වලට සම්බන්ධවූවන් තමන්ගේ කතා පවසන ප්‍රසිද්ධ හමු, ඡායාරූප, කතන්දර හා වාර්තා ප්‍රදර්ශන හෝ වීදි කලා සහ සංගීතය ආදිය.




බාබින් යාර් මිටියාවතේ දී සමූල ඝාතනයට ලක්වූ වින්දිතයින්ගේ ස්මාරකය ඡායාරූපය SERGIY PALAMARCHUK / ALAMY STOCK PHOTO

# සමූල ඝාතනය අනුස්මරණය කිරීම, යුක්රේනය

1941 සැප්තැම්බර් 29 සහ 30 යන දිනවල දී, යුක්රේනයේ බාබින් යාර් මිටියාවතේදී යුදෙව්වන් 33,771 ක් වෙඩි තබා ඝාතනය කරන ලදී. සෝවියට් සමයේදී මෙම සංහාරය සිහිපත් නොකළ තරම් වූ නමුත් එයින් පසුව සෑම වසරකදී ම එය සිහිපත් කර අනුස්මරණය කිරීම් පවත්වනු ලැබේ.

Ukrainian Jewish Encounter (UJE) යනු පොදු ඓතිහාසික වෘත්තාන්තයක් බිහිකිරීමට – එනම්, යුක්‍රේන-යුදෙව් සම්බන්ධතා පිළිබඳ අවංක, ඓතිහාසික විස්තරයක් සපයා දීමට සහ ඓතිහාසික තුවාල වලට විසඳුම් සෙවීමට, උදා: යුද්ධයට පෙර යුදෙව්වන් යුක්රේනයේ ජීවත් වූ ආකාරය පිළිබඳ දැනුවත්භාවය නැවත ඇතිකිරීම මගින් – කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධානයකි. මෙම සංහාරයේ 75 වැනි සංවත්සරයේ දී, UJE සංවිධානය මෙම සංහාරය අනුස්මරණය කිරීම සඳහා තරුණ සමුළුවක්, මහජන සම්මන්ත්‍රණයක් සහ ප්‍රසංගයක් ඇතුළුව සතියක් පුරා පැවති සැමරුම් ගණනාවක් සංවිධානය කළේය.

**මූලාශ්‍රය**: Ukrainian Jewish Encounter, ukrainianjewishencounter.org